www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

41361

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## மேல் மாகாணக் கல்வித் திணைக்களம்
## Department of Education - Western Province

### වර්ෂ අවසාන ඇගයීම
### ஆண்டிறுதி மதிப்பீடு - 2019
### Year End Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 09 | විෂයය / பாடம் / Subject | බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper | I ,II | කාලය / காலம் / Time | පැය 02යි. |
|---|---|---|---|---|---|---|---|

නම : ........................................................................ විභාග අංකය : ........................................

## I කොටස

සැලකිය යුතුයි :

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 20 දක්වා ප්‍රශ්නවලට ඉතාම නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
- නිවැරදි පිළිතුරකට ලකුණු 2 බැගින් මුළු ලකුණු 40 කි.

(1) බුදුන් වහන්සේ අවසන් වස් කාලය ගත කළේ,
1. සැවැත් නුවර හි ය.
2. බේලුව ගමෙහි ය.
3. විශාලා මහනුවර හි ය.
4. අම්බ ග්‍රාමයෙහි ය.

(2) එක සමාන ආනිසංස ඇති දාන දෙක ලෙස බුදුරජාණන් වහන්සේ වදාළේ,
1. අනේපිඩු සිටුතුමා හා විශාඛා සිටු දේවිය දුන් දානයයි.
2. කොසොල් රජු හා මල්ලිකා දේවිය දුන් දානයයි.
3. සුජාතා සිටු දියණිය හා චුන්ද කර්මාර පුත්‍රයා දුන් දානයයි.
4. නකුල මාතාව හා නකුල පිතා දුන් දානයයි.

(3) ''මහණෙනි කරුණාවෙන් ඔබ අමතමි. සියලු සංස්කාර ධර්මයන් නැසෙන සුළු ය. එබැවින් නොපමාව දුකින් මිදීම පිණිස කුසල් ධර්ම සම්පූර්ණ කරන්න.'' මෙම ප්‍රකාශය
1. බුදුරදුන්ගේ අවසන් අවවාදයයි.
2. බුදුරදුන්ගේ ප්‍රථම ධර්ම අවවාදයයි.
3. බුදුරදුන්ගේ අවසන් උදානයයි.
4. බුදුරදුන්ගේ ප්‍රථම ධර්ම දේශනාවයි.

(4) සතර අගති නිවැරදිව පිළිවෙලින් දැක්වෙන වරණය වන්නේ,
1. ඡන්දය, ද්වේශය, රාගය, මෝහය යි.
2. ඡන්දය, ලෝභය, භය, මෝහය යි.
3. ඡන්දය, ක්‍රෝධය, මෝහය, භය යි.
4. ඡන්දය, ද්වේශය, භය, මෝහය යි.

(5) සැදැහැවතුන් ඉතා දුර බැහැර සිට වෙහෙස මහන්සි වී ශ්‍රද්ධාවෙන් රැගෙන එන සිවුපසය පිළිගැන්වීමට සුදුසු වන බැවින් මහාසංඝරත්නය,
1. ආහුණෙය්‍යා නම් වන සේක
2. පාහුණෙය්‍යා නම් වන සේක.
3. දක්ඛිණෙය්‍යා නම් වන සේක.
4. අංජලීකරණීය නම් වන සේක.

(6) බුදුන්වහන්සේ පළමුවරට ලක්දිවට වැඩම කළේ,
1. උතුරු පළාතේ නාගදීපයටයි.
2. ඌව පළාතේ මහියංගනයටයි.
3. බස්නාහිර පළාතේ කැළණියටයි.
4. සබරගමු පළාතේ ශ්‍රීපාදස්ථානයටයි.



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

(7) සම්බුද්ධ ශාසනයේ අභිඥාලාභී භික්ෂුණීන් වහන්සේලා අතර අග්‍රස්ථානයට පත්වූයේ,
1. මහා ප්‍රජාපතී ගෝතමී තෙරණියයි. 2. කිසා ගෝතමී තෙරණියයි.
3. පටාචාරා තෙරණියයි. 4. භද්ද කච්චායනා තෙරණියයි.

(8) මහා ප්‍රජාපතී ගෝතමී දේවිය ඇතුළු ශාක්‍ය කුමාරිකාවන් 500 දෙනෙකුගේ පැවිදි වීමෙන් භික්ෂුණී ශාසනය ආරම්භ වූයේ,
1. බුද්ධත්වයෙන් වසර දෙකක් ගතවූ පසුව ය.
2. බුද්ධත්වයෙන් වසර තුනක් ගතවූ පසුව ය.
3. බුද්ධත්වයෙන් වසර හතරක් ගතවූ පසුව ය.
4. බුද්ධත්වයෙන් වසර පහක් ගතවූ පසුව ය.

(9) "අයහපත් දෑ මෙන්ම තමාට අහිත පිණිස හේතුවන දෑ ද පහසුවෙන් කළ හැකි බවත්, යහපත් දෑ මෙන්ම තමාට හිතකර වූ දේ කිරීම ඉතාම දුෂ්කර බවත්" යන අදහස ගෙන දෙන ධම්මපද ගාථාවේ මුල් පදය වන්නේ.....
1. නහී වේරේන වේරානි ....... යන්නයි.
2. සුකරානි අසාධූනි ........ යන්නයි.
3. අත්තනාව කතං පාපං ........ යන්නයි.
4. සේලෝ යථා ඒකඝනෝ ..... යන්නයි.

(10) "පව්කම් නොකිරීම, පව්කම් නොකරවීම, අන් අය කරන පව් අනුමත නොකිරීම" යන තුන් ආකාරයකින් සීලය ආරක්ෂා කිරීම හැඳින්වෙන්නේ,
1. අත්තූපනායික ධර්ම පර්යාය යනුවෙනි. 2. ත්‍රිකෝටි පාරිශුද්ධ ශීලය යනුවෙනි.
3. ලෝක පාලක ධර්ම යනුවෙනි. 4. පංචසීල ප්‍රතිපදාව යනුවෙනි.

(11) "ස්වාමියාට පළමුව අවදිවීම, ස්වාමියා දුන් දෙය පමණක් ගැනීම, වැඩ කටයුතු ඉතා මැනවින් ඉටු කිරීම" යන යුතුකම් ඉටුවිය යුත්තේ,
1. භාර්යාව විසින් ස්වාමි පුරුෂයාට ය. 2. සේවකයා විසින් ස්වාමියාට ය.
3. යහලුවා විසින් තම යහලුවාට ය. 4. ස්වාමියා විසින් සේවකයාට ය.

(12) බුදුරජාණන් වහන්සේ තුළ පැවති අටලෝ දහමින් කම්පා නොවීමේ උතුම් ගුණය
1. පුරිසදම්ම සාරථී ගුණය නම් වේ. 2. අරහං ගුණය නම් වේ.
3. සත්ථාදේව මනුස්සානං ගුණය නම් වේ. 4. තාදී ගුණය නම් වේ.

(13) ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සීල ශික්ෂාවට අයත් මාර්ග අංග නිවැරදිව දැක්වෙන වරණය වන්නේ,
1. සම්මා දිට්ඨි, සම්මා සංකප්ප හා සම්මා වාචා යන අංගයන් ය.
2. සම්මා වාචා, සම්මා කම්මන්ත හා සම්මා ආජීව යන අංගයන් ය.
3. සම්මා ආජීව, සම්මා වායාම හා සම්මා සති යන අංගයන් ය.
4. සම්මා දිට්ඨි, සම්මා සති හා සම්මා සමාධි යන අංගයන් ය.

(14) සියලු සත්ත්වයෝ ජීවත්වන්නේ ආහාරයෙනි ආහාර ගැනීමෙන් අප බලාපොරොත්තු වන ප්‍රධාන අරමුණු වන්නේ,
1. උපන් කුසගිනි වේදනා දුරුකර ගැනීම යි. 2. නූපන් කුසගිනි වේදනා දුරුකර ගැනීම යි.
3. ශරීරයේ යහපැවැත්මයි. 4. ඉහත කරුණු සියල්ලමයි.

(15) ධම්මපදට්ඨ කථාවේ එන කථා පරිවර්තනය කරමින් පොදු ජනයාට උචිත පරිදි දඹදෙණි යුගයේදී රචනා වූ ග්‍රන්ථය වන්නේ,
1. කව්සිළුමිණ මහා කාව්‍යයි. 2. පූජාවලියයි.
3. සද්ධර්මරත්නාවලියයි. 4. සද්ධර්මාලංකාරයයි.



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

(16) ණය නොවී සිටිමින් විඳිනු ලබන සැපය බුදු දහමේ හඳුන්වන්නේ,

1. අත්ථි සුඛ වශයෙනි.
2. භෝග සුඛ වශයෙනි.
3. අණන සුඛ වශයෙනි.
4. අණවජ්ජ සුඛ වශයෙනි.

(17) "දානං සීලං පරිච්චාගං.................." යන ගාථාවෙන් කියැවෙන්නේ,

1. දස සක්විති වත් පිළිබඳවයි.
2. දස රාජ ධර්ම පිළිබඳවයි.
3 දස පුණ්‍ය ක්‍රියා පිළිබඳවයි.
4. දස කුසල් පිළිබඳවයි.

(18) "මාඝාත ආඥාව" හෙවත් කිසිදු සත්ත්වයකු නොමැරිය යුතු බවට ලක්දිව නීති පනවන ලද්දේ,

1. දුටුගැමුණු රජතුමා විසින්ය.
2. බුද්ධදාස රජතුමා විසින් ය.
3. ආමණ්ඩ ගාමිණී අභය රජතුමා විසින්ය.
4. සද්ධාතිස්ස රජතුමා විසින් ය.

(19) "යම් සේ එකිනෙකට බැඳුණු අන්ධයින් වැලක් වේද එහි පළමු අන්ධයා ද මග නොදකියි, මැද සිටින අන්ධයා ද මග නොදකියි. අග සිටින්නා ද මග නොදකියි." ශ්‍රද්ධාව සම්බන්ධව මෙම උපමාව වඩාත් ගැලපෙන්නේ,

1. අමූලිකා ශ්‍රද්ධාවට ය.
2. ආකාරවතී ශ්‍රද්ධාවට ය.
3. සම්පසාදන ලක්ඛණ ශ්‍රද්ධාවට ය.
4. ඔක්කප්පන ශ්‍රද්ධාවට ය.

(20) ආර්ය අෂ්ඨාංගික මාර්ගයට අනුව නොකළ යුතු වෙළඳාම් ආදී වැරදි ජීවන වෘත්තීන්ගෙන් වෙන්ව යහපත් ජීවන වෘත්තීයක යෙදීම.

1. සම්මා කම්මන්තයයි.
2. සම්මා ආජීවයයි.
3. සම්මා වායාමයයි.
4. සම්මා සමාධියයි.

(ලකුණු $2 \times 20 = 40$)

---

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුළු ව තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද අනෙකුත් ප්‍රශ්න 4 සඳහා ලකුණු 10 බැගින් ද හිමි වෙයි.

---

(1) පාසල් පාදක තක්සේරුකරණයට අදාළව ඔබ පන්ති කාමරයේදී සිදු කරන ලද ඇගයීම් ඇසුරු කර ගනිමින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) තෙවන වාරය සඳහා ඔබ පන්ති කාමරයේදී සිදු කළ ඇගයීම කුමක් ද?

(ii) එම ඇගයිම සඳහා යොදා ගත් පාඩම කුමක් ද?

(iii) එම ඇගයීම සිදු කිරීමේදී ගුරුතුමා / ගුරුතුමියගෙන් ලැබුණු උපදෙස් දෙකක් ලියන්න.

(iv) එහිදී ඔබ මුහුණ දුන් ගැටලු දෙකක් ලියන්න.

(v) එම පන්තිකාමර ඇගයීමේදී ඔබ ජීවිතයට ලබාගත් ගුණාංග 02 ක් නම් කරන්න.

(vi) ගිහියාගේ නිත්‍ය ශීලය කුමක් ද?

(vii) අප විසින් සෑම තරාතිරමක සත්ත්වයෝ සඳහා මෛත්‍රිය වැඩිය යුතු බව බුද්ධ දේශනාවයි. එම සත්ත්ව කොටස් 02 ක් නම් කරන්න.

(viii) පරිසරය සුරකීමට අප ගත යුතු ක්‍රියා මාර්ග 2 ක් ලියන්න.

(ix) පරිසරය සුරකීමට අදාළ බුද්ධ දේශනා 02 ක් ලියන්න.

(x) 'සියල්ලෝම දඬුවමට බිය වෙති. සියල්ලෝ ම මරණයට බියවෙති. තමා උපමා කර අනුන් නොනැසිය යුතුය. නොමැරවිය යුතුය." මෙම අදහස ගෙනදෙන ධම්මපද ගාථාව ලියන්න.

(ලකුණු $2 \times 10 = 20$)



agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

(02) (i) බුදුන් වහන්සේ අවසාන කාලසීමාවේ ගත කළ ස්ථාන 02 ක් නම් කරන්න. (ල. 2)

(ii) ස්තූප තනා පිදිය යුතු පුද්ගලයන්ගෙන් තිදෙනෙකු නම් කරන්න. (ල. 3)

(iii) සම්බුද්ධ පරිනිර්වාණ සමයේ සිදුවීම් තුළින් අපට ගතහැකි ආදර්ශ පහක් දක්වන්න. (ල. 5)

(03) (i) "චේතනාහං භික්ඛවේ කම්මං වදාමි" මෙම පාලි පාඨයේ අර්ථය ලියන්න. (ල. 2)

(ii) දස අකුසල් අතරින් 03 ක් නම් කරන්න. (ල. 3)

(iii) බුදුන් වහන්සේට හා මහරහතන් වහන්සේලාට අකුසල කර්ම විපාක දුන් අයුරු නිදසුන් සහිතව සාකච්ඡා කරන්න. (ල. 5)

(04) (i) "නීරෝගීකම උතුම්ම ලාභයයි." මෙම අදහස දෙන පාලි ගාථා පාඨය ලියන්න. (ල. 2)

(ii) ආහාර අනුභවයේ දී අප සැළකිලිමත් විය යුතු කරුණු රැසකි. ඒ අතරින් 03 ක් නම් කරන්න. (ල. 3)

(iii) කායික නීරෝගීතාවය පුද්ගලයාගේ ජීවිතයේ දියුණුවට හේතුවන ආකාරය පැහැදිලි කරන්න. (ල. 5)

(5) (i) දෙවන ධර්ම සංගායනාවට මූලිකත්වය ගත් මහරහතන් වහන්සේ කවුද? (ල. 2)

(ii) දස අකැප වස්තු අතරින් 03 ක් නම් කරන්න. (ල. 3)

(iii) පැවැත්වීමට හේතුව, මූලිකත්වය, අනුග්‍රාහකත්වය, පැවැත් වූ ස්ථානය, ප්‍රතිඵල 02 ක් යන කරුණු ඇතුළත් වන සේ තුන්වන ධර්ම සංගායනාව පිළිබඳ කෙටි සටහනක් ලියන්න. (ල. 5)

(06) (i) අනුරධපුර සාහිත්‍ය යුගයේ රචිත දැනට ඉතිරිව ඇති පැරණිම කෘතිය කුමක් ද? (ල. 2)

(ii) කුරුණෑගල සාහිත්‍ය යුගයේ රචිත සාහිත්‍ය කෘති 03ක් නම් කරන්න. (ල. 3)

(iii) කෝට්ටේ යුගයේ රචිත කාව්‍ය ග්‍රන්ථ රාශියකි. ඒ අතරින් එකක් පිළිබඳ විස්තරයක් කරන්න. (ල. 5)

(07) පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට කෙටි සටහන් ලියන්න.

(i) බුදු බව පැතූ බලංගොඩ ආනන්ද මෛත්‍රේය මහා නායක හාමුදුරුවෝ

(ii) ආනාපානසති භාවනාව

(iii) බෞද්ධයාගේ අත්පොත බඳු වූ ධම්මපදය

(iv) බෞද්ධ කලා ශිල්ප

(ලකුණු 2 x 5 = 10)



Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

agaram.lk